# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2052/23 – 2018 ජනවාරි මස 04 වැනි බ්‍රහස්පතින්දා – 2018.01.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/10/25/2012.

**කාර්මික ආරවුල් පනත 131 වන අධිකාරය**

අංක 2041/22 දරන හා 2017.10.19 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශවයක් වශයෙන් දොඹෙමඩ, කුඩාගම හි පදිංචි ඒ. පී. කේ. වීරරත්න මයා හා අනෙක් පාර්ශවය වශයෙන් රත්මලාන, ගාලුපාර හි පිහිටි ප්‍රධාන කාර්යාලය, ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය අතර පැවති කාර්මික ආරවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A 3643 දරන හා 2017.07.11 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් ඒ. පී. කේ. වීරරත්න මයා වෙතින් කාර්මික ආරවුල් පනතේ 20 (1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A 3643 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මක වීම 2018.10.19 දින සිට අවසන් වන බවට පනතේ 20 (2) (ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2017 දෙසැම්බර් මස 19 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**පළමුවන උපලේඛනය**
**'' ආ'' ආකෘති පත්‍රය**

*(3 වන නියෝගය)*

**1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනත**

*බේරුම්කරුවෙකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම*

ලිපිනය: කුඩාගම, දොඹේමඩ.
දිනය: 2017.11.28

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතට ය.

2017.10.19 දිනැති අංක 2041/22 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද්දා වූ ද ඒ. පී. කේ. වීරරත්න සහ ජාතික ජලසම්පාද හා ජලාපවහන මණ්ඩලය බැඳී සිටින්නා වූ ද 2017.07.11 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*පිටපත (අනෙක් පාර්ශවය)*

ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලය,
ප්‍රධාන කාර්යාලය,
ගාලුපාර,
රත්මලාන.

01 - 511

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.